# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 245/6 — 1976 දෙසැම්බර් 29 වැනි බදාදා — 1976.12.29

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# (I) වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### කෞතුකාගාර ශත සංවත්සරය සැමරීම සඳහා විශෙෂ මුද්දර තුනක් නිකුත් කිරීම

කෞතුකාගාර ශත සංවත්සරය සැමරීම සඳහා රු. 5.00, රු. 1.00 සහ ශත 50 වටිනාකම් වලින් යුත් විශෙෂ තැපැල් හා ආදායම් මුද්දර තුනක්, 1977 ජනවාරි 01 දින සිට විකිණීම සඳහා නිකුත් කරන බව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම මුද්දර තොග අවසන් වනතුරු විකිණෙනු ඇත. දැනට අලෙවියෙහි පවත්නා සමාන වටිනාකම් වලින් යුත්, එනම්, රු. 5.00, රු. 1.00 සහ ශත 50 මුද්දර ද නව මුද්දර සමග අඛණ්ඩව අලෙවි කරනු ලැබේ.

2. 1977 ජනවාරි මස 01 වෙනි දින නිකුත් කරන,

(i) රු. 5.00 මුද්දරය—තාරා දෙව්දුවගේ මූර්තිය පිළිබිඹු කරයි.

(ii) රු. 1.00 මුද්දරය—සුන්දර මූර්තිස්වාමිගේ මූර්තිය පිළිබිඹු කරයි.

(iii) ශත. 50 මුද්දරය—මෛත්‍රිය බෝධිසත්වයන්ගේ මූර්තිය පිළිබිඹු කරයි.

සී. සිවප්‍රකාසම්,
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,
කොළඹ 1.
1976 දෙසැම්බර් 27.

12-75


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

1 A—ජ 24337—4,470 (76/12)